# හම්බන්තොට දිස්ත්‍රික්කයේ කසාගල රජමහ විහාරය සහ කෑගලු දිස්ත්‍රික්කයේ වට්ටාරම රජමහ විහාරය යන විහාරයන්හි ඇති පුස්කොළ පොත් එකතුව පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඩී. පී. තුසිත උයද කුමාර්*

**සංක්ෂේපය**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදීම යි. සමස්ත දිවයිනම ආවරණය කිරීමට නොහැකි නිසා පුස්කොළ පොත් පවතින ප්‍රධාන රජමහා විහාරයක් වන වට්ටාරම රජමහ විහාරය සහ කසාගල රජමහ විහාරය නියදිය වශයෙන් තෝරා ගැනීමට හේතුව වන්නේ එම විහාරස්ථානය අනුරාධපුර යුගයට අයත් රජමහ විහාර වන අතරම එම විහාරවල පුස්කොළ එකතුව ග්‍රන්ථ විද්‍යාත්මක තත්වය පිළිබඳ සාධාරණීකරණය කළ හැකිය.

අධ්‍යයනයට ලක් කරන්නා වූ එකතුව තුළ විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමට අතිරේකව ඒවායේ ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට මෙම අධ්‍යයනයේ දී බලාපොරොත්තු වූ අතරම පුස්කොළ පිළිබඳ ක්‍රමවත් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර කවරේද යන්න පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනය මඟින් සිදුකරනු ලැබේ.

මෙම අධ්‍යයනයේ දී පුස්කොළ පොත් පිළිබඳ වාර්තාගත කිරීමේදී භාවිත කළ යුතු විස්තරාංග, සංඛ්‍යා ලේඛනාවලිය, පෙළගැස්වීමේ විධික්‍රමය යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළෙමු.

මෙහි නිගමනය වුයේ වැඩි කොටසක් ත්‍රිපිටක පොත් වන අතර දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, ඊට අමතරව වෙද පොත් අදී පුස්කොළ මෙහි විය. මෙම විහාරස්ථානවල පුස්කොළ පොත් 170 පමණ විය. එමෙන්ම මෙහි විශාලම පොත වශයෙන් ජාතක පොත් වහන්සේ විය. පුස්කොළ පොත් එකතුව සුරක්ෂිත එකතුවක් බව පොන්වාදිය හැකි ය.

**මුඛ්‍ය පද :-කසාගල රජමහ විහාරය, කෑගලු දිස්ත්‍රික්කය, පුස්කොළ පොත්, පුස්කොළ පොත් එකතු, පුස්කොළ පොත් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු, වට්ටාරම රජමහ විහාරය, හම්බන්තොට දිස්ත්‍රික්කය**

1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
thusithaudayakumara89@gmail.com